සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

08 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

කාලයඃ- පැය 02 යි.

නම / විභාග අංකයඃ-..................................................................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

(01) නාට්‍යයක තේමාව යනු,

(1) කථා වස්තුවේ නමයි (2) නාට්‍ය පෙලින් ප්‍රකාශ වන අදහසයි

(3) ප්‍රේක්ෂකයා හඳුන්වන නාමය වේ (4) නාට්‍යයේ එන චරිතයන්ගේ නාමයයි

(02) නාට්‍ය පෙළක වරහන් තුළ දක්වා ඇත්තේ,

(1) රංග විධාන (2) ප්‍රශ්නාර්ථ (3) ගීත,කවි,සින්දු (4) සංවාද

(03) රංගන ශිල්පියාගේ ප්‍රධාන මාධ්‍ය වනුයේ

(1) දෙබස් (2) රූපය (3) අභිනය (4) නර්තනය

(04) ශ්‍රී ලංකාවේ ඓතිහාසික කතා ඇතුලත් චිත්‍රපට ලෙස දැක්විය හැකි වරණය වන්නේ,

(1) මහරජ ගැමුණු, අබා, ඇහැලේපොල කුමාරිහාමි (2) කුසපබා, ධර්ම යුද්ධය, මහින්දාගමනය

(3) සිරි රජසිරි, සූරිය අරණ, අබා (4) මහින්දාගමනය, අබා, සූරිය අරණ

(05) ළමා නාට්‍ය නිර්මාණයකි

(1) හුණුවටය (2) කැළණි පාලම (3) සෙල්ලම් ලෙල්ලම් (4) දික්තල කාලගෝල

(06) කටහඬ අභ්‍යාස කිරීම සඳහා යොදා ගතහැකි ග්‍රන්ථයක් වන්නේ,

(1) බයිබලය (2) ගුත්තිල කාව්‍ය (3) සකස්කඩ (4) පන්සිය පනස් ජාතකය

(07) නාට්‍යයේ සිද්ධි මාලාව ගැලපීම යනු

(1) ගැටුම වේ (2) රංග වින්‍යාසය වේ (3) කතා වින්‍යාසය වේ (4) අභිරූපණය වේ

(08) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය පමණක් දැක්වෙන්නේ

(1) කෙටිකතා, චිත්‍ර, නාට්‍ය (2) නර්තනය, සංගීතය, මූර්ති

(3) චිත්‍රපටිය, කැටයම්, චිත්‍ර (4) නාට්‍ය, චිත්‍රපට, ටෙලිනාට්‍ය

(09) නාට්‍යයක ආනුශාංගික කලාවන්ට අයත් නොවන්නේ,

(1) අංග රචනය (2) රංග වස්ත්‍රාභරණ (3) නාට්‍ය පිටපත (4) නාට්‍ය සංගීතය

(10) මනසින් යමක් මවා පෑම

(1) පරිකල්පනය වේ (2) අභිරූපණය වේ (3) සමාරෝපය වේ (4) ස්ථානෝචිත ප්‍රඥාව වේ

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (✗) ලකුණද යොදන්න

(11) වෙද පුටුව රංග අභ්‍යාසයකි ( )

(12) රූකඩ නිර්මාණ බර වැඩි විය යුතුය ( )

(13) චිත්‍ර කලාවේ ප්‍රධාන මාධ්‍ය වර්ණ හා රේඛා වේ ( )

(14) වේෂ භූෂණ යනු ආහාර්ය අභිනයට අයත් අංගයකි ( )

(15) අභිනය සංකල්පය මුලින්ම හඳුන්වා දෙන ලද්දේ එදිරිවීර සරත්චන්ද්‍ර මහතා වේ ( )

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා (A) කොටසට අදාළ වරණය (B) කොටසින් තෝරා යා කරන්න

| A | B |
|---|---|
| (16) කදා වළලු | සැහැල්ලු කිරීම |
| (17) පාස්කු නාට්‍ය | පසුතල |
| (18) ශිථිලකරණ | සේරිවාණිජ කතාව |
| (19) නාට්‍ය සංගීතය | ඇහැළ මලින් ගස් පිරිලා |
| (20) චිත්‍ර වස්ත්‍ර | ආගමික කතා |

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

08 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - II පත්‍රය

නම / විභාග අංකයඃ-..................................................................

- පළමු ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01)

(1) මාෂා හා වලහා නාට්‍යයේ නිර්මාණකරුගේ නම ලියන්න (ලකුණු 3)

(2) මාෂා හා වලහා නාට්‍යයේ ගැටුමට තුඩු දෙන චරිත 2ක් නම් කරන්න (ලකුණු 3)

(3) මාෂා හා වලහා නාට්‍යයේ තේමාව කුමක් ද? (ලකුණු 3)

(4) මාෂා හා වලහා නාට්‍යයේ මාෂාගේ චරිත ලක්ෂණ 2 ලියන්න (ලකුණු 3)

(5) මාෂා හා වලහා නාට්‍යයේ ඔබ කැමති ගීත කොටසක් ලියන්න (ලකුණු 3)

(02)

(1) රංග අභ්‍යාස යනු කුමක් ද? (ලකුණු 3)

(2) රංග අභ්‍යාසවල නිරත වීමෙන් ලැබෙන ප්‍රයෝජන 6ක් ලියන්න (ලකුණු 6)

(3) ඉන් ඔබ කැමති රංග අභ්‍යාසයක් සිදුකරන අයුරු පියවරෙන් පියවර ලියන්න (ලකුණු 6)

(03)

(1) නාට්‍ය පෙළ රචකයන් තිදෙනෙකු නම් කරන්න (ලකුණු 3)

(2) නාට්‍යයෝචිත අවස්ථාවක තිබිය යුතු ලක්ෂණ 3ක් ලියන්න (ලකුණු 6)

(3) කතාවක් හෝ සිදුවීමක් නාට්‍යයක් බවට පත් කිරීමේදී සැලකිය යුතු කරුණු 6ක් ලියන්න (ලකුණු 6)

(04)

(1) අභිනය යන්න පැහැදිලි කරන්න (ලකුණු 3)

(2) සංවාද ගීත අයත් අභිනය නම්කොට ඔබ දන්නා නාට්‍යයකින් සංවාද කොටසක් ලියන්න (නාට්‍යයේ නම ද ලිවිය යුතුයි) (ලකුණු 6)

(3) නාට්‍යයට අවශ්‍ය අනුශාංගික කලා 6ක් නම් කරන්න (ලකුණු 6)

(05)

(1) වේදිකා පසුතල නිර්මාණය යනු කුමක් ද? (ලකුණු 3)

(2) වේදිකා පසුතල නිර්මාණයට ගන්නා අමු ද්‍රව්‍ය 6ක් නම් කරන්න (ලකුණු 6)

(3) වේදිකා පසුතල නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 6ක් ලියන්න (ලකුණු 6)

(06)

(1) භාහිර සමාරෝපය යනු කුමක් ද? (ලකුණු 3)

(2) රජ චරිතයට අවශ්‍ය මීරිවැඩි සඟලක් නිර්මාණය කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය මොනවාද? (ලකුණු 6)

(3) එය නිර්මාණය කර ගන්නා අයුරු පියවරෙන් පියවර ලියන්න (ලකුණු 6)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**08 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - පිළිතුරු පත්‍රය**

### I පත්‍රය

(01) 2

(02) 1

(03) 3

(04) 1

(05) 3

(06) 3

(07) 3

(08) 4

(09) 3

(10) 1

(11) ×

(12) ×

(13) ✓

(14) ✓

(15) ×

(16) සේරිවාණිජ කතාව

(17) ආගමික කතා

(18) සැහැල්ලු කිරීම

(19) ඇහැල මලින් ගස් පිරිලා

(20) පසුතල

### II පත්‍රය

(01)

(1) ඩී.කුමාරගේ (ලකුණු 3)

(2) මාෂා , වලහා , මී මැස්සෝ (ලකුණු 3)

(3) 1.සෑම අයෙකු තුලම හොඳ ගතිගුණද ඇත
2.ස්ථානෝචිත ප්‍රඥාව සෑම අයෙකු තුලම තිබිය යුතුය
3.නපුරු නරක ළමයි සැමවිටම ප්‍රතික්ෂ්ප වේ
4.අවිහිංසාව හොඳ ගුණයකි
5.හොඳ අය ආශ්‍රයෙන් නරක අය පවා හොඳ මගට හැරේ (ලකුණු 3)

(4) 1.විටෙක අකීකරු මෙන්ම විටෙක කීකරු ළමයෙකි
2.වැරදි පිළිගෙන ඒවා හදා ගනී
3.තැනට සුදුසු නුවණින් කටයුතු කරයි (ලකුණු 3)

(5) ගීත කොටස (මාෂා හා වලහා නාට්‍යයේ එන) නිවැරදිව ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න (ලකුණු 3)

(02)

(1) රූපණ කාර්යය සඳහා නළුවාගේ සිරුර හා මනස සකස් කිරීමට යොදා ගන්නා අභ්‍යාස වේ (ලකුණු 3)

(2) 1.ශරීරයේ නම්‍යශීලීත්වය ඇති වීම
2.ශරීරය රිද්මයානුකූලව අවධානයෙන් යුතුව ක්‍රියා කරවීමේ හැකියාව ලැබීම
3.සබකෝලය දුරු වීම

4.කටහඬ පැහැදිලිව හා අර්ථාන්විතව පාලනය කිරීමේ හැකියාව ලැබීම

5.මනස සැහැල්ලු කරගැනීම

6.සිත එක් අරමුණක තබා ගැනීමට හැකිවීම

7.ආත්ම විශ්වාසය ගොඩනැගීම

8.මතකය වර්ධනය වීම ආදී කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න (ලකුණු 6)

(3) ඕනෑම රංග අභ්‍යාසයක් සිදු කරන ආකාරය නිවැරදිව පියවර සහිතව ලියා තිබේ නම් ලකුණු පිරිනමන්න (ලකුණු 6)

(03)

(1) දයානන්ද ගුණවර්ධන

ඩී.කුමාරගේ

අමිතා රබ්බිඩිගල

පාලිත ලොකුපෝතාගම

එදිරිවීර සරත්චන්ද්‍ර ආදී ඕනෑම වේදිකා නාට්‍ය පිටපත් රචකයෙකු නම්කර ඇත්නම් ලකුණු දෙන්න

(ලකුණු 3)

(2) 1.ප්‍රධාන සිදුවීමට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවක් ගොඩනැගීම

2.ප්‍රේක්ෂකයා තුල කුතුහලය ඇතිකිරීම

3.ගැටුම් අවස්ථාවක් නිර්මාණය කිරීම ආදිය සරලව ලියා තිබුනද ලකුණු පිරිනමන්න (ලකුණු 6)

(3) 1.නාට්‍යෝචිත අවස්ථා තෝරා ගැනීම

2.සිද්ධි පිළිවෙලින් පෙළ ගැස්වීම

3.තේමාවක් ඉස්මතු කිරීම

4.කථාවක් නාට්‍ය පෙළක් බවට පත් කිරීමේදී සිදුකල යුතු වෙනස්කම් තෝරා බේරා ගැනීම

5.රංග කාර්යය සඳහා උචිත නිර්මාණයක් වීම

6.චරිත සඳහා සුදුසු සංවාද ගොඩනැගීම

7.ගැටුමක් නිර්මාණය කිරීම

8.ආරම්භය, වර්ධනය, ගැටුම් අවස්ථා හා අවසානය සහිත නිර්මාණයක් වීම (ලකුණු 6)

(04)

(1) ඉදිරියට ගෙන ඒම

කර පෙන්වීම ආදී පිළිතුරක් ප්‍රමාණවත්ය (ලකුණු 3)

(2) සංවාද - වාචික අභිනය

ගීත ගායනය(නලුවා විසින්) - වාචික අභිනය

පසුබිම් ගීත හා සංගීතය - ආහාර්ය අභිනය

- වේදිකා නාට්‍යයක සංවාද කොටසක් නිවැරදිව ලියා ඇත්නම් ලකුණු දෙන්න (ලකුණු 6)

(3) අංග රචනය, රංගාලෝකය, වේෂභූෂණ, වේදිකා පසුතල, සංගීතය, නර්තනය (ලකුණු 6)

(05)

(1) නාට්‍ය පිටපතෙන් කියැවෙන කාලය හා දේශයට මෙන්ම නාට්‍ය ශෛලියට අදාළව නිර්මාණාත්මකව ඒ ඒ ජවනිකාවලට සුදුසු පරිසරය වේදිකාවේ නිර්මාණය කිරීමයි (ලකුණු 3)

(2) ලී පතුරු, හාඩ්බෝඩ්, හිස් ගෝනි, අමුරෙදි, ලී කුඩු , බයින්ඩර් ගම්, වර්ණ ආදිය (ලකුණු 6)

(3) 1.නාට්‍යයේ කථාවට උචිත විය යුතුය

2.නාට්‍යයේ යුගයට(කාලයට) උචිත වීම

3.නාට්‍යයේ ශෛලියට අදාළ වීම

4.නිර්මාණාත්මක බව

5.අඩු පිරිවැයකින් නිර්මාණය කිරීම

6.සැහැල්ලු වීම හා සරල වීම

7.ඉක්මනින් සවි කිරීමට හා ඉවත් කිරීමට හැකිවීම

8.නලු කාර්යයට රුකුලක් වීම (ලකුණු 6)

(06)

(1) නලුවා ස්වකීය චරිතයේ බාහිර ස්වරූපය අනුව වෙස් ගැන්වීමයි (ලකුණු 3)

(2) මිරිවැඩි සඟලක් නිර්මාණයට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලියා තිබේ නම් ලකුණු දෙන්න (ලකුණු 6)

(3) එම අමු ද්‍රව්‍ය යොදා ගනිමින් මිරිවැඩි සඟලක් නිර්මාණය කිරීම පිළිවෙලින් දක්වා ඇත්නම් ලකුණු පිරිනමන්න (ලකුණු 6)